# ගුත්තිල හා අයින්ස්ටයින් පඬිවරු

මාර්ටින් වික්‍රමසිංහ මහතා තේරුම් නොගත් තවත් බොහෝ දෑ විය. අප මෙහි දී ඒ මහතා විවේචනය කරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විකල්ප සංස්කෘතියක් හා බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට වෙනස් වූ චින්තනයක් වර්ධනය කරගැනීමේ දී ඒ මහතාගේ අදහස් එයට එරෙහිව සිටින බැවිනි. ඒ මහතා අනුගමනය කරන්නන් අතර ජාතිකත්වය අගය කරන්නන් ද විශාල පිරිසක් සිටින බැවින් ඒ මහතාගේ අදහස් පිළිබඳ යම් සඳහනක් කළයුතු වෙයි.

අප කලින් කිහිප වතාවක් ම සඳහන්කර ඇති ආකාරයට වික්‍රමසිංහ මහතා සිංහල සංස්කෘතිය භාරතීය සංස්කෘතියෙන් වෙනස් බව පෙන්වීමට තැත්කෙළේ බටහිර සංස්කෘතිය පැත්තේ සිට ය. සිංහල බෞද්ධ සංස්කෘතියේ ඇතැම් වැදගත් අංග බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි අංගවලට සමාන යැයි ඒ මහතා විශ්වාස කෙළේ ය. අප අමතක නොකළ යුතු කරුණක් නම් භාරතීය සංස්කෘතිය හා බමුණු මත අපේ ජනතාව විසින් ප්‍රතික්ෂෙප කෙරුණු නමුදු දඹදිව හා සිංහල බෞද්ධ සංස්කෘතිය අතර යම් සම්බන්ධයක් ඇති බව ය.

අප බොහෝ විට කියා ඇති පරිදි ඉන්දියාව බටහිරයන්ගේ ද, භාරතය වෛදිකයන්ගේ ද නිර්මාණ වෙයි. දඹදිව යන්න වෛදිකයන් ඒ ප්‍රදේශයට පැමිණීමට පෙර ඒ හැඳින්වූ නාමය විය හැකි ය. දඹදිව, භාරතය හා ඉන්දියාව යන්නෙන් ඇතැම් විට සමපාතී භූමි ප්‍රදේශ හඳුන්වනු ලැබුව ද, සංස්කෘතික හා දේශපාලනික වශයෙන් ඒ වෙනස් වෙයි. බුදුන්වහන්සේ වැඩ සිටියේ දඹදිව මිස භාරතයෙහි නො වෙයි. බිම්බිසාර රජු මෙන් ම ධර්මාශෝක රජු ද දඹදිව රජවරු වූහ. අඩුම තරමින් සිංහල බෞද්ධයනට ඒ එසේ විය. හස්තිනාපුර යනු භාරතයේ නගරයක් වූ අතර නව දිල්ලිය ඉන්දියාවේ නගරයක් වෙයි. සිංහල බෞද්ධයනට වැදගත් වූයේ දඹදිව මිස භාරතය නො වෙයි. අද පවා සිංහල බෞද්ධයන් වන්දනාවේ යන්නේ දඹදිව මිස භාරතයට හෝ ඉන්දියාවට හෝ නො වේ.

සිංහල බෞද්ධ සංස්කෘතිය විසින් භාරතීය වෛදික සංස්කෘතිය ප්‍රතික්ෂෙප කෙරුණේ දඹදිව ඇතුළු මේ කලාපයේ පැරණි අනාර්ය (ද්‍රවිඩ නොව) සංස්කෘතිය පැත්තෙන් බලා මිස බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පැත්තෙන් බලා නො වෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතාට තේරුම් ගැනීමට නොහැකි වූ කරුණ එය විය. තත් නැති වීණාව ඊනියා අධියථාර්ථවාදයක් (surrealism) හෝ ඉන්ද්‍රජාලික යථාර්ථවාදයක් (magic realism) හෝ නොව කිසිදා නො ඇසූ, මනසින් පවා මවාගත නොහැකි තරමේ සංගීතයක් ගැන කීමට යොදාගත්, පැරණි අනාර්ය සංස්කෘතියට අයත් උපක්‍රමයක් පමණක් විය. ඒ සමස්ත කතාවෙහි යහමග පෙන්වීමක් ද විය.

ගුත්තිල පඬිතුමා තම දෙමව්පියන්ට උපස්ථාන කරමින් රාජ සභාවෙහි සංගීතඥයකු ලෙස කටයුතු කෙළේ ය. එතුමා එකල විසූ අග්‍රගණ්‍ය වීණා වාදකයා විය. එතුමා රාජ සභාවෙහි රජුට සේවය කිරීම ඊනියා වැඩවසම් ක්‍රමයට අනුගත වූ සේවකයකුගේ නිවට වැඩක් ලෙස දකින ඊනියා ප්‍රගතිශීලීන් ද සිටිය හැකි ය. එහෙත් මේ ප්‍රගතිශීලීහු කරුණු දෙකක් අමතක කරති. ඔවුහු පළමුවෙන් ම මධ්‍යකාලීන යුරෝපයේ බිහි වූ ප්‍රධාන සංගීතඥයන් යුරෝපීය වැඩවසම් සමාජවල බිහිවූවන් බව සැලකිල්ලට නො ගනිති. දෙවනුව තමන් අද සේවය කරන්නේ එක්කෝ ධනපති ව්‍යාපාරිකයකුට හෝ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ රටවලින් යැපෙන රාජ්‍ය නොවන සංවිධානවලට හෝ බව ඔවුන්ට අමතක වෙයි.

කෙසේ හෝ වීණා වාදනය ඉගෙනීමට මහත් කැමැත්තක් දැක්වූ මූසිල ගුත්තිල පඬිතුමා සමීපයට පැමිණෙයි. ඒ ඉතා රසවත් කතාවකි. ගුත්තිලයෙහි එය කදිමට විස්තර කෙරෙන්නේ වෑත්තෑවේ හිමිපාණන් විසිනි. ගුත්තිල පඬිතුමාගේ දෙමව්පියන් අතින් ද මූසිලට ගුත්තිල පඬිතුමාට සාපේක්ෂව තම තත්වය තේරුම් ගැනීමට සලස්වමිනි. මූසිල වීණා වාදනයකිරීම ගුත්තිල පඬිතුමාගේ දෙමව්පියන්ට දැනී ඇත්තේ මීයන් වීණාව කෑමක් ලෙස ය !

ගුත්තිල පඬිතුමා මූසිලයා දුටු වහාම ඔහු දුර්ජනයකු බවත් ඔහුට ඉගැන්වීමෙන් අවැඩක් ම වන බවත් තේරුම් ගනියි. එහෙත් දෙමව්පියන්ගේ ඇවිටිල්ල හේතුකොටගෙන අවසානයේ දී මූසිලට උගන්වයි. ගුරුමුෂ්ටිවල වටිනාකමක් ඇත්තේ ශාස්ත්‍රය දුර්ජනයන් අතට පත්වීම වැළැක්වීමෙහි දී ය. එහෙත් ගුත්තිල පඬිතුමා ගුරුමුෂ්ටි නැතිව ම මූසිලට

උගන්වනවා පමණක් නොව ගෝලයාට රාජ සභාවෙහි විණා වාදනයකිරීමට අවස්ථාව සලසා දෙයි. එහෙත් මුසිල සමාන සේවයට සමාන වැටුප් ඉල්ලයි. මෙය සමාන වැටුප් ඉල්ලීමකට ද වඩා රාජ සභාවෙහි ප්‍රධාන වීණා වාදකයා තේරීම පිළිබඳ ප්‍රශ්නයක් වෙයි. මහළු ගුත්තිල පඬිතුමා අසරණ වන්නේ රජු ඒ තීරණයකිරීම සඳහා වාදයක් පැවැත්වීමට තීරණයකිරීමත් සමග ය. මෙහි දී රජු ක්‍රියාකරන්නේ ද මුසිලට දෙවැනි නොවන අයුරකිනි. රජු කළයුතුව තිබුණේ ගුත්තිල පඬිතුමා සේවයට පැමිණෙන තෙක් එතුමා ප්‍රධාන විණා වාදකයා බව මුසිලට කීම ය.

මේ ගැන ද විවිධ අර්ථකථන දෙන්නෝ වෙති. මහළු ගුත්තිල පඬිතුමා මුසිලට තැන දී ඉවත්ව ගිය යුතුව තිබූ බව පවසන්නෝ වෙති. එහෙත් බොහෝ දෙනා තේරුම් නොගන්නා කරුණක් වෙයි. රජුට ද ඒ නොතේරුණ බව පැහැදිලි ය. ගුත්තිල පඬිතුමා සංගීත නිර්මාණකරුවෙක් විය. එහෙත් මුසිලට හැකි වූයේ සංගීතය ප්‍රතිනිර්මාණයකිරීම ය. ගුත්තිල පඬිතුමා කළ වාදනයක් මුසිලට ද කළ හැකි විය. එහෙත් අළුතින් යමක් නිර්මාණයකිරීමට තරම් මුසිල දක්ෂයෙක් නො වී ය. ඒ බව සංගීතවාදයෙහි දී පැහැදිලිව ම පෙන්නුම් කෙරිණි. ඒ හැරත් තම ගුරුවරයා සිටිය දී ඔහුගේ තැන ඉල්ලීම එකල පැවති සංස්කෘතියට ආගන්තුක විය.

මෙකල ද වැඩිහිටි ගුරුවරුන්ට විද්‍යාඥයන්ට සැලකීම බටහිර සංස්කෘතියෙහි පවා දක්නට ලැබෙන්නකි. ඇමරිකාවේ ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලය අයින්ස්ටයින්, ගර්ඩිල් ආදී පඬුවන්ට සැලකුවේ ඔවුන්ගේ වයස නිසා ඔවුන්ට දැන් කිසිවක් කිරීමට නොහැකි ය යන මතයේ පිහිටා නො වෙයි. ඔවුන්ට විශ්වවිද්‍යාලයේ කළයුතු රාජකාරියක් නොවිණි. දේශන පැවැත්වීම හෝ වෙනත් යමක් කිරීමක් ඔවුන්ගෙන් බලාපොරොත්තු නොවිණි. අවශ්‍ය නම් විශ්වවිද්‍යාලයේ පොදු කාමරයේ පියානෝව වාදනයකර ඔවුන්ට ආපසු යෑමට හැකිවිණි. ඔවුන්ට විශ්වවිද්‍යාලය සැලකුවේ ඔවුන් ඒ වන විට කරමින් සිටි සේවයකට නොව ඔවුන්ගෙන් බටහිර විද්‍යාවට හා ගණිතයට එයට කලින් ඉටු වූ සේවය සඳහා ය. ඒ දෙදෙනාම එකා කලක ඉතාම ඉහළ නිර්මාණකරුවෝ වූහ. ඔවුන් නිර්මාණකරණය නතරකිරීමෙන් පසුව ඔවුන්ගේ ගෝලයෝ ඔවුන්ගේ තැන නොඉල්ලූහ. ඒ තැන ගෝලයකුට කිසි දිනෙක ලබාගත හැක්කක් ද නො වෙයි. අයින්ස්ටයින්ලා ගර්ඩිල්ලා අවුරුදු පතා බිහි නො වෙති. ඔවුන්ගේ මරණයෙන් දශක ගණනාවකට පසුව ද අද වන තුරු ඒ මට්ටමේ කිසිවකු බිහි වී නැත. ඒ හැරත් සමාන සේවයට සමාන වැටුප් යන්න බොරු කතාවක් පමණකි. ඒ තර්කය අනුව විශ්‍රාම වැටුප් නොගෙවිය යුත්තේ විශ්‍රාමිකයන් ඉටුකරන සේවයක් නැති බැවිනි.

ඉතා පැහැදිලිව ම මුග්ධයකු වූ රජුට ගුත්තිල පඬිතුමාගේ අගය, එතුමාගේ ඉතා ඉහළ නිර්මාණකරණය වටහාගත නොහැකි වී ඇත. ගුත්තිල පඬිතුමා ශෝකයට පත්වන්නේ එවිට ය. එතුමා නිවසින් පිටවී යන්නේ මේ තත්වයට මුහුණ දෙන්නේ කෙසේ දැයි සිතමිනි. එතුමාගේ අති ප්‍රබල සංගීත මනස නැවතත් අවදිවන්නේ ඒ අවස්ථාවෙහිදී ය. සක් දෙවිඳුගේ පැමිණීම ලෙස අප දකින්නේ මේ මනස නැවත ක්‍රියාත්මක වීම ය. ඕනෑම අනුකාරකයකු එයට අවශ්‍ය කිනම් යථාර්ථවාදයක් කියාගත්තත් අපට කමක් නැත. අපි අනුකාරකයන් හඳුනමු. අනුකාරකයකු ද දුර්ජනයකු ද වූ මුසිල ද හඳුනමු. මෙවැනි අනුකාරක දුර්ජනයන් මෙරට ජාතික ව්‍යාපාරයේ ද දක්නට ඇත.

ඒ කෙසේ වෙතත් මහා සංගීතවාදය එළඹියේ ය. ගුත්තිල පඬිතුමා අළුත් නිර්මාණ ඉදිරිපත් කෙළේ ය. තත් නැති වීණාවෙන් නැගුණු හඬට සුර ලඳුන් දුන් රඟ අපට මවා පෙන්වූයේ ගුත්තිල කතුවරයා ය. මුසිලට කළ හැකි වූයේ කුමක් ද? අනුකාරකයකු වූ මුසිල ගුත්තිල පඬිතුමා අනුකරණය කිරීමට ගොස් විණාව කඩා ගත්තේ ය. ඔහුගේ වීණාවෙන් හඬක් නිකුත් නොවිණි. විය යුතු පරිද්දෙන් ම ජනයා මුසිලට දඬුවම් දුන්නෝ ය.

අද බොහෝ දෙනා සමාන සේවයට සමාන වැටුප්, ගුත්තිල පඬිතුමාගේ ඊර්ෂ්‍යාව ආදිය ගැන කතාකරන්නේ ගුත්තිල පඬිතුමා සහ මුසිල සමාන තත්වයෙහි ලා සලකමිනි. එය අයින්ස්ටයින් විද්වතා සහ අනුකාරක සාමාන්‍ය භෞතික විද්‍යා මහාචාර්යවරයකු සම තත්වයෙහි ලා සැලකීමට සමාන ය. මේ ඊනියා විචාරකයෝ තමන් ජීවත්වන තමන් අගයකරන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පවා කටයුතු සිදුවන්නේ කෙසේ දැයි නො දනිති. ගුත්තිල කාව්‍යයෙහි ගුත්තිල පඬිතුමාගේ විණා වාදනයේ ශ්‍රේෂ්ඨත්වය වෙළෙඳුන්ගෙන් මෙන් ම දෙමව්පියන් මුසිලගේ වීණා වාදනයට දැක්වූ ප්‍රතිචාරයෙන් ද ඉතා පැහැදිලිව කියැවෙත් දී අපේ වත්මන් ඊනියා පඬිවරුන්ට ඒ ශ්‍රේෂ්ඨත්වය වටහා ගැනීමට නො හැකි වී ඇත්තේ ඔවුන් නියම ශ්‍රේෂ්ඨත්වය නොහඳුනන අනුකාරකයන් රැළක් පමණක් ම වන බැවිනි.

© Prof. Nalin De Silva

ගුත්තිල කාව්‍යයෙහි යහමග පෙන්නුම් කරන්නේ පාඨකයාට ඒ හිතාගැනීමට ඉඩක් නොතබා ය. දුර්ජනයන්ට මෙලොවත් පරලොවත් තම ක්‍රියාවන්ගේ විපාක විඳීමට සිදුවන බව එකහෙළා ප්‍රකාශ කෙරෙයි. එසේ නොමැතිව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි මෙන් කුහක ව ක්‍රිස්තියානි සංස්කෘතියට වාසි ගෙන දෙන අන්දමේ ප්‍රකාශ ව්‍යංගයෙන් කියා අප කිසිම පණිවුඩයක් කලා කෘතියෙන් නොදෙන බව නො කියැවෙයි.

ඒ කෙසේ වෙතත් ඉහතින් දක්වන ලද්දේ ගුත්තිලය  පිළිබඳ කළහැකි එක් විචාරයක් පමණකි. ඒ විචාරයෙහි ඊනියා පාරභෞතිකය ප්‍රතික්ෂේපකිරීමක් කියැවෙන්නේ යැයි යමකුට ප්‍රකාශකළ හැකි ය. සක් දෙවිඳු පැමිණ ගුත්තිල පඬිතුමාට උපකාරකිරීම එතුමාගේ සිතෙහි ඇතිවන ප්‍රබල වෙනසක් ලෙස මෙහි අර්ථකථනය කෙරී ඇත. සක් දෙවිඳු භෞතික වශයෙන් නැති බැවින් එවැනි අර්ථකථනයක් දී පාරභෞතික මිථ්‍යාවල නොඇලෙන බව අප ප්‍රකාශකර ඇතැයි කියමින් කිසිවකු අපට චෝදනාකිරීමට ඉඩ ඇත.

සක් දෙවිඳු අපට කිසිසේත් ම ප්‍රශ්නයක් නො වෙයි. අපට පාරභෞතික යනුවෙන් විශේෂිත සංකල්පයක් නැත. අපට පාරභෞතික මිථ්‍යා යනුවෙන් අමුතු ප්‍රකාශ නැත්තේ අපට සියළු ප්‍රකාශ මිථ්‍යා බැවිනි. අපට ගුරුත්වාකර්ෂණය නිව්ටන් විසින් භාරතීය විද්‍යාඥයන්ගෙන් ණයට ගෙන නිර්මාණය කරන ලද්දකි. නිව්ටන් විද්වතා විසින් ප්‍රකාශයක්, එනම් ප්‍රවාදයක්, නිර්මාණය කෙරී ඇත. ගුරුත්වාකර්ෂණය පමණක් නොව සක් දෙවිඳු ද ප්‍රවාදයකි. අපි ඒ ප්‍රවාදයෙන් ඇතැම් විට වැඩගනිමු. ප්‍රවාද ඇත්තේ යමක් තේරුම් ගැනීමට මිස ඊනියා යථාර්ථයක් ගෙනහැර දැක්වීමට නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva